# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2019

2023 දෙසැම්බර්

මානවශාස්ත්‍ර පීඨය

**නාට්‍ය හා රංගකලාව** (නව/පැරණි නිර්දේශය)

**නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව DMAT – E 3015**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. නූතන යුගය උදාවීමෙන් පසු නව නාට්‍ය ශානර ප්‍රභවය වීම සඳහා යුරෝපය තුළ සමාජ-දේශපාලන සන්දර්භය සකස් වූ ආකාරය කාලානුක්‍රමික විකාශනය ද සැලකිල්ලට ගෙන පෙන්වා දෙන්න.

02. හෙන්රික් ඉබ්සන් සිය A Doll's House නාට්‍යයේ නෝරා ගේ චරිතය ඇසුරින් 'පුද්ගල නිදහස' මූර්තිමත් කරන අයුරු උදාහරණ ඇසුරින් පහදන්න.

නැතහොත්

පෞද්ගලික නිදහස සහ සමාජ සම්මතයන් අතර ගැටුම නූතන ට්‍රැජඩි නාට්‍යයෙහි ප්‍රමුඛ තේමාවක් ලෙස නිරූපණය කිරීමට හෙන්රික් ඉබ්සන් සමත් වී ඇති ආකාරය A Doll's House නාට්‍යය ඇසුරින් නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03. "ඇන්ටන් චෙකොෆ්ගේ චෙරිවත්ත (The Cherry Orchard) නාට්‍යය, එම නාට්‍ය රචනා කළ යුගයෙහි රුසියානු සංදර්භය තුළ වූ සමාජ, ආර්ථික විපරිනාමය නිර්මාණාත්මකව මූර්තිමත් කරයි." මෙම අදහස නිදසුන් සහිතව විමර්ශනය කරන්න.

04. රෝමාන්තිවාදය (Romanticism) යථාර්ථවාදයෙන් (Realism) වෙනස් වන්නේ කවර ලක්ෂණ පදනම් කරගෙනද? විමසන්න.

නැතහොත්

ස්වභාවිකවාදය (Naturalism) යථාර්ථවාදයෙන් (Realism) වෙනස් වන්නේ කවර ලක්ෂණ පදනම් කරගෙන ද? විමසන්න.

05. පරත්වාරෝපණය (Alienation) යන සිද්ධාන්තය ඉදිරිපත් කරමින් නූතනවාදී නාට්‍ය ප්‍රවණතා අතර බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් විසින් ඉදිරිපත් කළ සෛද්ධාන්තික ප්‍රවේශය විප්ලවීය යැ යි ඔබ පිළිගන්නේ ද? හේතු දක්වන්න.

06. ඇබ්සඩර් නාට්‍යකරුවෝ (Absurd Dramatists) සුසාධිත නාට්‍යකරුවන් (Well-made Dramatists) ගොඩනැගූ ආකෘතිය ද එහි ගැබ් වුණු නිරාකුල තර්කානුකූල අන්තර්ගතය ද උඩුයටිකුරු කළහ. මේ ප්‍රකාශය සම්බන්ධව ඔබේ මතය පැහැදිලි කරන්න.

07. නිස්සාරත්වයේ ව්‍යාධිය විසින් මිනිස් සිත හා විශ්වය අතර ශූන්‍යවාදී අර්ථ මතු කරන ආකාරය ගොඩෝ එනකං (Waiting for Godot) නාට්‍යය උදාහරණ වශයෙන් ගෙන පෙන්වා දෙන්න.

08. ඒ ඒ චරිතවලට අනන්‍ය වූ ආකාරයට ඇමරිකානු සිහිනය හඹායෑම සහ ඇමරිකානු සිහිනයෙන් පලායෑම නිරූපණය වී ඇති අයුරු ටෙනිසි විලියම්ස්ගේ පුංචි පළිඟු රූප (The Glass menageries) නාට්‍යය ඇසුරින් නිදසුන් සහිතව විමසන්න.

09. පහත සඳහන් නාට්‍යකරුවන් දෙදෙනෙකු පිළිබඳ කෙටි සටහන් ලියන්න.

a. ආතර් මිලර්
b. බර්ටෝල් බ්‍රෙෂ්ට්
c. සැමුවෙල් බෙකට්
d. ටෙනසි විලියම්ස්

************************************